# දේශපාලනයෙහි මුදල් පාලනය  කිරීම පිළිබඳ හැඳින්වීමක්

ආචාර්ය මැග්නස් ඕමන්
IFES ආයතනයෙහි දේශපාලන මූල්‍යකරණය පිළිබඳ ජ්‍යෝෂ්ඨ උපදේශක

2016

මැතිවරණ ක්‍රමවේදය සඳහා වූ අන්තර්ජාතික පදනම

© 2016 මැතිවරණ ක්‍රමවේදය පිළිබඳ අන්තර්ජාතික පදනම

*සියලු හිමිකම් ඇවරිණි*

අවසර ලබාදීමේ ප්‍රකාශය : IFES ආයතනයෙහි ලිඛිත අවසරය නොමැතිව මෙම ප්‍රකාශනයෙහි කිසිදු කොටසක් ඡායා පිටපත් කිරීම, පටිගත කිරීම හෝ කිසිදු තොරතුරු ගබඩා කිරීමේ ස්වරූපයකින් සහ ආපසු ලබා ගැනීමේ ක්‍රමවේදයක් ද ඇතුළු කිසිදු අයුරකින් නැවත පිටපත් කිරීම සිදුකළ නොහැකිය.

අවසරය ලබාගැනීම සඳහා වන ඉල්ලීමක පහත සඳහන් කරුණු අන්තර්ගත විය යුතුවේ.

- පිටපත් කිරීම සඳහා අවසර ඉල්ලා සිටිනු ලබන ලේඛනය පිළිබඳව විස්තරයක්
- පිටපත් කරනු ලබන ලේඛන කොටස් භාවිතා කරනු ලබන අරමුණ සහ ඒවා භාවිතා කරනු ලබන ස්වභාවය.
- ඔබගේ නම, තනතුර, සමාගමේ හෝ ආයතනයෙහි නම්, දුරකථන අංකය, ෆැක්ස් අංකය, විද්‍යුත් තැපැල් ලිපිනය සහ තැපැල් ලිපිනය.

අවසරය සඳහා වන සියලුම ඉල්ලීම් කරුණාකර පහත ලිපිනයට එවන්න:

මැතිවරණ ක්‍රමවේදයන් සඳහා වූ අන්තර්ජාතික පදනම 2011 ක්‍රිස්ටල් ඩ්‍රයිව්

අන්ර්ලිංග්ටන් : VA 22202

විද්‍යුත් තැපැල : clitor@ifes.org

ෆැක්ස් : 202.350.6701

*මෙකී ප්‍රකාශනයෙහි සඳහන් අදහස්, තොරතුරු නිගමනයන් සහ නිර්දේශයන් මෙම ප්‍රකාශනයෙහි කර්තෘවරයාගේ (වරුන්ගේ) වන අතර ඒවා අවශ්‍යයෙන්ම මැතිවරණ ක්‍රමවේදයන් සඳහා වූ අන්තර්ජාතික පදනමෙහි (IFES හි) අදහස් විද්‍යාමාන නොකෙරේ.*

# මැතිවරණ ක්‍රමවේදයන් සඳහා වන අන්තර්ජාතික පදනම (IFES)

නිදහස් හා සාධාරණ මැතිවරණයන්ට දායක වීමේ පුරවැසි අයිතිය සම්බන්ධයෙන් සහයෝගය දැක්වීම මැතිවරණ ක්‍රමවේදයන් සඳහා වන අන්තර්ජාතික පදනම (IFES) මගින් සිදු කරනු ලබයි. අපගේ ස්වාධීන ප්‍රවීණතාවය තුලින් මැතිවරණ ක්‍රමවේදයන් ශක්තිමත් කිරීම සහ චිරස්තායී විසඳුම් උදාකරගැනීම සඳහා දේශීය ධාරිතාවය ගොඩනංවනු ලබයි.

ප්‍රජාතන්ත්‍රවාදය ප්‍රවර්ධනය කිරීමේ ගෝලීය ප්‍රමුඛයා වශයෙන් අප පහත සඳහන් ක්‍රියාවන් තුලින් සහ පාලනය සහ ප්‍රජාතන්ත්‍රවාදී අයිතීන්ගේ ප්‍රගමනය වෙනුවෙන් කටයුතු කරනු ලබයි:

- මැතිවරණ නිලධාරීන් සඳහා තාක්ෂණික සහාය ලබාදීම.
- නිසි නියෝජනයක් නොමැති ජනකොටස් දේශපාලන ක්‍රියාවලියට දායක කරගැනීම සඳහා බලගැන්වීම.
- මැතිවරණ චක්‍රය වැඩි දියුණු කරලීම උදෙසා ක්ෂේත්‍රය පාදක කරගත් පර්යේෂණ භාවිතා කිරීම.

වර්ෂ 1987 සිට මැතිවරණ ක්‍රමවේදයන් සඳහා වන අන්තර්ජාතික පදනම මගින් සංවර්ධනය වන ප්‍රජාතන්ත්‍රවාදයන්හි සිට පරිණත ප්‍රජාතන්ත්‍රවාදයන් දක්වා රටවල් 135 කට අධික ප්‍රමාණයක අප ආයතනය සිය ක්‍රියාකාරීත්වය සිදුකර තිබේ. *වැඩිදුර විස්තර සඳහා www.ifes.org වෙත පිවිසෙන්න.*

දශකයකට අධික කාල පරාසයක් තුළ IFES ආයතනය මගින් දේශපාලනයෙහි මූල්‍යකරණය පිළිබඳ වන විනිවිදභාවය සහ වගවීම යන කරුණු සම්බන්ධයෙන් සහයෝගය ලබා දී තිබේ.

ප්‍රජාතන්ත්‍රික හා මැතිවරණ ක්‍රියාවලීන් සම්බන්ධයෙන් IFES ආයතනයෙහි ක්‍රියාකාරකම් වලට ඌණ පූර්ණයක් වන්නේ, දේශපාලන මූල්‍යකරණයට සහයෝගය දැක්වීම තුළින් දේශපාලන ක්‍රමවේදය පිළිබඳව මහජන විශ්වාසය ඉහළ නැංවිය හැකි වන අතර දේශපාලනික දූෂණය/අකටයුතුකම් අඩු කරගත හැකිය.

IFES ආයතනයෙහි දේශපාලනික මූල්‍යකරණය පිළිබඳ ක්‍රියාකාරකම් අතරට පාර්ලිමේන්තු මැතිවරණ කළමණාකරණ ආයතන, දේශපාලන පක්ෂ, සිවිල් සමාජය සහ මාධ්‍ය ආදිය ද ඇතුළත්ව ලෝකයෙහි සියලුම කලාපයන් ආවරණය වන පරිදි රටවල් 40 කට අධික සංඛ්‍යාවක දියත් කර තිබේ.

**පටුන**


හැඳින්වීම............................................................................................................ 2

දේශපාලනයෙහි මුදල් හේතුවෙන් උද්ගත විය හැකි ප්‍රශ්න................................ 3

රාජ්‍ය දේපළ අවභාවිතය........................................................................................ 5

දේශපාලන මූල්‍යකරණය හා බැඳි විධිමත් නියාමනය........................................... 7

බලාත්මක කිරීම..................................................................................................... 13

සිවිල් සමාජයෙහි සහ මාධ්‍යයෙහි භූමිකාව............................................................ 15

නිගමනයන්.......................................................................................................... 17

පරිශීලන මූලාශ්‍ර....................................................................................................... 18


## හැඳින්වීම

*"දේශපාලනයෙහි මව්කිරි මුදල් වේ"*

ජෙස් උන්රු (එක්සත් ජනපද දේශපාලනඥයෙකු සහ කැලිෆෝනියාවේ රාජ්‍ය භාණ්ඩාගාරික, 1922-1987)

විවිධ කලාපයන් සහ රටවල් අතර දේශපාලනික තත්වයෙහි ස්වාභාවයන්/ස්වරූපයන් සැලකිය යුතු මට්ටමකින් වෙනස් වන අතරම, දේශපාලනික තීරණ ගැනීමේ ක්‍රියාවලියෙහි දී මුදල් වල අදාලත්වයක් නොමැති කලාපයක් ලෝකයෙහි නොමැත.

රූප සටහන 1: දේශපාලන මූල්‍යකරණය ඕනෑම නූතන සමාජයක ප්‍රධාන කේන්ද්‍රීය සාධකයක් වේ




දේශපාලනයෙහි මුදල්, හෝ දේශපාලන මූල්‍යකරණය වූ කලී නූතන සමාජයෙහි ප්‍රධාන අංශයන්ට සම්බන්ධිතය.

දේශපාලන මූල්‍යකරණය කළමණාකරණය කිරීම අවශ්‍ය කාරණයක් වන්නේ එතුලින් සැබෑ මැතිවරණයක් සහ මැතිවරණ ව්‍යාපාරයන් හි පැවැත්ම සහතික කළ හැකි නිසාවෙනි. ඒ මන්ද යත් එවැනි නිසි මූල්‍ය කළමණාකරණයක් නොමැති කල්හි මැතිවරණ අපේක්ෂකයන් අතර තරගය උඩුයටිකුරු කිරීමට තරම් හැකියාවක් පැවතීමයි. නිසි මූල්‍ය කළමණාකරණයක් තුලින් ඵලදායී ලෙස රට පාලනය වන බව තහවුරු වන නමුදු දූෂණය තුලින් යහපාලනය ඉතා පහසුවෙන් විනාශ විය හැකිය.

ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක් එහි පුරවැසියන් සමඟ නිරන්තර සංවාදයක යෙදිය යුතු අතර ඒ සඳහා මූල්‍ය සම්පත් අවශ්‍ය වේ. මෙහිදී සළකා බැලිය යුතු කාරණය වන්නේ මුදල් භාවිතය හේතුවෙන් දේශපාලකයින් තමන්ගේ ඡන්ද දායකයින්ට වඩා වැඩියෙන් තමන්ට ආධාර උපකාර අනුග්‍රහයන් දැක්වීම කළ දායකයින්ට ප්‍රතිචාර දැක්වීමේ ඉඩකඩක් පැවැතීමය. මෙහිදී දූෂණය නොවූ සහ නීත්‍යානුකූල අරමුදල් මගින් දූෂ්‍ය ක්‍රියාකාරකම් හෝ හැසිරීම් සඳහා දේශපාලකයින්ගේ, දේශපාලන පක්ෂ වල සහ රාජ්‍ය නිලධාරීන්ගේ උත්සුකභාවය අඩු කරනු ඇති අතර මුදල් යන කාරණය පැවතීම තුලින්ම මෙකී අවධානම් සහගත තත්ත්වය ඇති කරනු ද ලබයි.

මුදල් යනු දේශපාලනය තුළ ගැටළුකාරී තත්ත්වයක් ඇති කිරීමට හේතුපාදක වන මෙන්ම දේශපාලනයට අවශ්‍ය අංගයක්ද වන හෙයින් එහි බලපෑම කෙසේ පාලනය කළ හැකිද යන්න අය විසින් සළකා බැලිය යුතු අතර එහිදී එයින් උද්ගත වන අහිතකර තත්ත්වයන්ට ප්‍රතික්‍රියා දැක්වීම සහ එය පාලනය කිරීම නිසි පරිදි කළ යුතු වේ. මෙහිදි සියළුම රටවල් සඳහා ගැලපෙන්නා වූ සුපරීක්ෂණ ආදර්ශයක් නොමැති ඒ ඒ රටවල් වල ඉලක්කයන් සහ ආමන්ත්‍රණය කිරීමට අපේක්ෂිත ගැටළු ඒ ඒ රටවල් වල සමාජ, ආර්ථික සහ දේශපාලනික තත්ත්වයන්ට අනුකූල විය යුතු වේ. ඒ එක් එක් රටවල අත්දැකීම් වලින් අනෙක් රටවල් වලට පාඩම් ඉගෙනීමට හැකියාවක් නොමැති බව ඉන් අදහස් නොවේ.

## දළ විශ්ලේෂණය

දේශපාලන මූල්‍යකරණයෙහි ඇති මූලික ප්‍රශ්න සහ ඒවාට පිළියම් කවරේද යන්න පිළිබඳව මෙකී සංක්ෂිප්ත සටහන මගින් ඉදිරිපත් කෙරේ. මේ සම්බන්ධයෙන් බොහෝ ගැටළුකාරී තත්ත්වයක් තිබිය හැකි පසුබිමක, මෙම ලියවිල්ල තුළින් ඉදිරිපත් කිරීමට අප තෝරා ගෙන ඇත්තේ රාජ්‍ය දේපළ අවභාවිතා කිරීම සහ එවැනි තත්ත්වයක් නියාමනය කිරීම සහ මැඩලීම කෙතරම් දුෂ්කරද යන්න පැහැදිලි කිරීමත්ය.

තවද මෙකී ලියවිලිල තුළින් ලෝකයේ විවිධ රටවල් තුළ දේශපාලන මූල්‍යකරණය යන කාරණය නියාමනය කිරීම හා සම්බන්ධ ගෝලීය අත්දැකීම් ආමන්ත්‍රණය කරනු ලබන්නා සේම, අදාළ රෙගුලාසි බලාත්මක කිරීම කෙලෙස කළ හැකිද යන කාරණය කෙරේද අවධානය යොමු කරනු ලැබේ. ඒ අනුව, හෙළිදරව් කිරීම/අනාවරණය කිරීම පිළිබඳ රීති (මූල්‍ය වාර්තාකරණය) වියදම් සහ දායකත්වය ලබා දීම සම්බන්ධයෙන් වන තහනම් කිරීම් සහ සීමාවන් සහ රාජ්‍ය අරමුදල් සැපයීම ආදී කාරණාවන් මෙහිදී ඉස්මතු කර දැක්වේ. තවද, සිවිල් සමාජයන්හි සහ මාධ්‍යයෙහි කාරයභාරය පිළිබඳව ද මෙහිදී කරුණු ඉදිරිපත් කරනු ලබන අතර දේශපාලන මූල්‍ය කරණය පිළිබඳ සුපරීක්ෂණ හා සම්බන්ධ ගෝලීය උගත් පාඩම් පිළිබඳව ද අදහස් ඉදිරිපත් කෙරේ.

මෙකී ලියවිල්ල තුලින් ඉදිරිපත් කරනු ලබන ආකාරයට දේශපාලන මූල්‍යකරණය යනුවෙන් අප මෙහිදී නිර්වචනය කරනු ලබන්නේ දේශපාලන පක්ෂ වල සහ මැතිවරණ ව්‍යාපාරයන්හි මූල්‍ය තත්ත්වයන්ය. මෙහිදී තේරී පත්වන මහජන නියෝජිතයන්ගේ හැසිරීම දේශාපානයෙහි මුදල් යන කාරණයේදී දේශපාලකයින් සහ රාජ්‍ය නිලධාරින් මුහුණදෙන ලැදියාවන්හි ගැටුම්කාරී තත්ත්වයන් ද ඇතුළුව ඉහත කී නිර්වචනට වඩා පුළුල් වූ අර්ථ දැක්වීම් ද තිබිය හැකිය.

## දේශපාලනයෙහි මුදල් හේතුවෙන් උද්ගත වියහැකි ගැටළු

මෙම ලියවිල්ලෙහි සඳහන් කළ පරිදි, නූතන දේශපාලනය තුළ මුදල් යනු අවශ්‍ය අංගයක් සේම එය මගින් ලෝකයෙහි ප්‍රජාතන්ත්‍රවාදයන් තුළ බොහෝ ගැටළු නිර්මාණය කිරීමේ අභියෝගයන්ද උද්ගත කරයි. මේ කිනම් ආකාරයකින් වූවද, ඉහත කී ආකාරයෙන් උද්ගත කරනු ලබන ගැටළුකාරී තත්ත්වයන් තුළින් ඡන්දදායකයා සහ ඡන්දයෙන් තෝරා පත් කරනු ලබන හෝ එලෙස පත්වීමට උත්සාහ දරණ පුද්ගලයින් අතර සම්බන්ධතාවයෙහි බිඳ වැටීමක් ඇති වේ. මෙහිදී උද්ගතවිය හැකි නිශ්චිතව ගැටළුව ඒ ඒ කලාපයන් හෝ රටවල් අනුව වෙනස් විය හැකිය. පහතින් සඳහන් වන්නේ වඩාත් සුලබ අභියෝගයන් කිහිපයකි.

**ධනය සම්බන්ධ ලැදියාවන් මඟින් දේශපාලන ක්‍රමවේදයට අයථා බලපෑමක් විය හැකිය.**

එක් පුද්ගලයෙක් එක් ඡන්දයක් යන මූලධර්මය පොදුවේ ලොව පුරා ස්ථාපිත වූ කාරණයක් වූවද සම්පත් පිළිබඳ වන වෙනස්කම් තුලින් සමහර අදහස් තවත් අදහසක් අභිබවා යැමට හේතු විය හැකිය. මුදල් තිබෙන තැනැත්තන්ට දේශපාලකයින්ට සහ දේශපාලන තීරණ සම්බන්ධයෙන් බලපෑම් කළ හැකි අතර එවැනි තත්ත්වයන් ප්‍රජාත්නත්‍රවාදයට අගතිගාමී විය හැකිය.

**ව්‍යාපාරයන් තුළින් මැතිවරණ ක්‍රියාදාමයන්ට දායකත්වය ලබාදීම රාජ්‍ය මූල්‍යයෙහි දූෂණයට මගපෑදිය හැකිය.**

බොහෝ රටවල දේශපාලන පක්ෂ වලට සහ මැතිවරණ ව්‍යාපාරයන්ට පරිත්‍යාග ලබාදීමේ ඉඩකඩ පුද්ගලික ව්‍යාපාරික සමාගම් වලට ලබාදී තිබේ. කෙසේ නමුත්, දේශපාලකයින් තමන්ට දායකත්වය ලබා දුන් සමාගම් සඳහා පක්ෂග්‍රාහී තත්ත්වයක් දැක්වීය හැකිය යන අවධානම බොහෝ රටවල් තුළ තිබේ. මේ තත්ත්වය රාජ්‍ය ප්‍රතිසම්පාදන සහ සංවර්ධන කටයුතු කෙරේ අහිතකර බලපෑමක් ඇති කළ හැකි අතරම එතුළින් ප්‍රජාතන්ත්‍රවාදයට හානියක් සිදුවනවා පමණක් නොව, පරිපාලනයෙහි සහ රාජ්‍ය පාලනයෙහි ද ඵලදායීතාවයන්ට අගතියක් ද ගෙන දිය හැකිය.

**රාජ්‍ය දේපළ අවභාවිතා කිරීම.**

ආණ්ඩු පාලනයෙහි සිටින දේශපාලන පක්ෂ සිය බලය තහවුරු කරගෙන පාලනයෙහි අඛණ්ඩව සිටීම සඳහා රාජ්‍ය දේපළ කෙරෙහි ඔවුන්ට ඇති ප්‍රවේශය අයථා පරිදි භාවිතා කිරීමේ තත්ත්වය ලෝකයේ බොහෝ කලාපයන් තුලින් දැකිය හැකිය. මෙම තත්ත්වය මෙකී වාර්තාවේ ඉදිරි පරිච්ඡේදයන්හි දී සාකච්ඡාවට බඳුන් කරනු ලැබේ.

**නීතිවිරොධී අරමුදල් මඟින් දේශපාලනයට බලපෑම් කිරීම**

නීතිවිරෝධී අරමුදල් මඟින් දේශපාලනයට කෙරෙන බලපෑම වර්තමාන ලෝකයෙහි සමහර කලාපයන්හි වර්ධනය වෙමින් පවත්නා ගැටළුවකි. සමහර අවස්ථාවන්හි දී අපරාධකරුවන් නීතියේ රැහැනින් මිදීම සඳහා රාජ්‍ය පාලනයට සම්බන්ධ වීමේ අපේක්ෂාවන් මැතිවරණ ව්‍යාපාරයන්ට මුදල් යෙදීම සිදුකරනු ලබයි. මේ අතර, සමහර අවස්ථාවන්හි දී අපරාධකරුවන් සම්බන්ධයෙන් පවතින විමර්ෂණ කටයුතු වලින් මිදීම සඳහා ද දේශපාලනඥයින් වෙත අරමුදල් පරිත්‍යාග කිරීමේ තත්ත්වයන් ද තිබේ.

**විදේශ අරමුදල්හි බලපෑම ජාතික දේශපාලන තත්ත්වයන්ට තර්ජනයක් වීමේ හැකියාව**

වඩාත් ගෝලීයකරණයට ලක්වූ අපගේ ලෝකය තුළ වුවද, සෑම රටක් තුළම සිය රටට ආවේණික වූ දේශපාලනික ආයතනික ව්‍යුහයන්, එනම් ජාතික සහ පළාත් පාලන දේශපාලන අධිකාරීන් පවත්වාගෙන යෑම සිදු කරනු ලබයි. මැතිවරණ ව්‍යාපාරයන් සඳහා විදෙස් අරමුදල් භාවිතා කිරීමේ දී, දේශපාලඥයින් තමන්ගේ රටේ ඡන්ද දායකයින්ගේ අවශ්‍යතාවයන් වලට වඩා වැඩි ප්‍රමුඛතාවක් තමන්ට මූල්‍ය ආධාර ලබාදුන් විදෙස් රටවල ලැදියාවන් කෙරේ දැක්වීමට නැඹුරු වේ. මෙකී තත්ත්වය පුළුල් ලෙස සිදු වන්නේ නම්, රටක ස්වාධිපත්‍යයට එය තර්ජනයක් විය හැකිය.

**මැතිවරණ ව්‍යාපාරයන් තුළ අධික ලෙස මුදල් වියදම් කිරීමේ තත්ත්වයන් තුලින් අලුත් දේශපාලන ප්‍රවාහයන්ට නැඟී සිටීමට ඇති ඉඩකඩ සීමා කළ හැකිය.**

කිසිදු ආධාර සපයන්නෙකු දේශපාලන ප්‍රවාහයට අයථා බලපෑමක් නොකලද, නීති විරෝධී අරමුදල්, විදෙස් අරමුදල් හෝ වෙනයම් ආකාරයක අයථා මූල්‍ය භාවිතයක් නොතිබුනද, හුදෙක් මුදල් යන කාරණය පැවතීම තුලින්ම අහිතකර ප්‍රතිවිපාකමය තත්ත්වයක් උද්ගත කළ හැකිය. මැතිවරණ ව්‍යාපාරයන් සඳහා භාවිතා කෙරෙනු ලබන මූල්‍ය තත්ත්වයන් හී අධික කම නිසාවෙන්ම නව දේශපාලන බලවේගයන්ට ඉස්මතු විය නොහැකි නම්, එහිදී සැබෑ මහජන මතයන්ට ගැලපෙන පරිදි දේශපාලනික ප්‍රවාහයන්හි සුදුසු වෙනස්කම් සිදුවීමට ඉඩකඩක් නොමැති වේ. දේශපාලනයට ප්‍රවේශ වීමට අපේක්ෂාවෙන් පසුවන කාන්තාවන් මුහුණ දෙන මූලිකම ගැටළුවක් වී ඇත්තේ මෙහිදී පෙන්වා දුන් ආකාරයට මැතිවරණ ව්‍යාපාරයන් සඳහා අධික මුදල් භාවිතා කිරීමයි. එනම්, ඉතා ඉහල ධනවත්කම් වලින් යුක්ත වූ පාර්ශවකරුවන් සඳහා කාන්තාවන්ට එතරම් ඉඩකඩක් නොමැතිය යන කරුණු හේතුවෙන් ඉහත කී ගැටළුකාරී තත්ත්වය උද්ගත වීම පොදුවේ සුලබව දැකිය හැකිය.

**ඡන්ද මිලදී ගැනීම**

පොදු මහජන කැමැත්ත තුලින් මැතිවරණ ජයග්‍රහණය කිරීමට වඩා මුදල් වියදම් කිරීම තුලින් මැතිවරණ ජයග්‍රහණය කිරීම ලෝකයේ බොහෝ කලාපයන්හි සුලබව දැකිය හැකි තත්ත්වයක් බවට පත්වී තිබේ. සමහර අවස්ථාවන්හිදී, ඡන්ද මිලදී ගැනීම් ඍජු ගනුදෙනුවක ස්වරූපයෙන්ම සිදු වන අතර එහිදී අදාළ ඡන්දදායකයින් තමන් ඡන්දය භාවිතා කළ ආකාරය පෙන්වන සිය ඡන්ද කාඩ්පත ලකුණු කළ ආකාරය පිළිබඳ තොරතුරු ජංගම දුරකථනයකින් ගන්නා ලද ඡායාරූපයකින් හෝ වෙනයම් ආකාරයක සාක්ෂියක් මගින් ලබා දීමෙන් පසු මුදල් ලබා ගැනීම සිදු කෙරේ. තවත් සමහර අවස්ථාවන්හිදී විවිධාකාර ආගමික නායකයින් හෝ ප්‍රජා නායකයින් සඳහා ද දිරි දීමනා ලබා දීම තුලින් ඒ ඒ පුද්ගලයන්ගේ අනුගාමිකයින්ගේ ඡන්ද ලබා ගැනීමට සිදු කෙරේ. මේ කවර ආකාරයකින් වුවද, ඡන්ද මිලදී ගැනීම තුලින් ප්‍රජාතන්ත්‍රවාදී මැතිවරණයන් සඳහා දැඩි අහිතකර බලපෑමක් එල්ල කෙරේ.


## රාජ්‍ය දේපළ අවභාවිතය

> "බලයේ සිටින පක්ෂය මගින් රාජ්‍ය දේපළ අයථා ලෙස භාවිතය තුලින් මැතිවරණ තරගකාරීත්වයට හානි සිදුකිරීමට අමතරව රාජ්‍ය පාලනයෙහි ගරුත්වයට ද අහිතකර ලෙස බලපායි"
>
> ස්ශේක්, බෘනො සහ ෆොන්ටානා, ඇලෙස්සැන්ඩ්‍රා
>
> (පද්ධතිය පුරාකෑම නැමති ප්‍රකාශනය ඇසුරින්)

මැතිවරණ සම්බන්ධ තරඟකරුවන් බොහෝමයක් සිටිය හැකි අතර, ඒ තුළ යම් පිරිසක් බලයෙහි සිටිමින්ම තරඟ කරනු ලබයි. මෙහිදී රජය මගින් ලබාගත හැකි සම්පත් භාවිතා කිරීමට ඇති පෙළඹවීමට ප්‍රතිවිරෝධය දැක්වීම බොහෝ දුෂ්කරය.

ඇෆ්ගනිස්ථානයේ සිට සිම්බාබ්වේ දක්වා ගත්කළ, බලයෙහි සිටින පාලකයින්ගේ මැතිවරණ ව්‍යාපාර හෝ දේශපාලන පක්ෂ සඳහා ආධාර පිණිස රාජ්‍ය දේපළ භාවිතා කිරීම සම්බන්ධයෙන් වන චෝදනා සුලබ කරුණක් වී තිබේ. මේ තත්ත්වය තුලින් මැතිවරණ ව්‍යාපාරයන්හි යෙදීම සඳහා විපක්ෂයන්ට ඇති ඉඩකඩ සම්බන්ධයෙන් දැඩි දුෂ්කර පසුබිමක් නිර්මාණය කෙරේ.

රූප සටහන 2: රජ්‍ය සම්පත් වල ස්වාභාවයන්




මෙම තත්ත්වයෙහි උපරිමයට ගිය විටදී, රජය සහ පාලන බලය හිමි දේශපාලන පක්ෂය අතර වෙනස ඉතා නොපැහැදිලි තත්ත්වයට පත්වන අතර විටෙක එකිනෙක වෙනස පවා වෙන්කර හඳුනා ගැනීමට දුෂ්කර වේ. එවැනි අවස්ථාවන්හිදී, මැතිවරණයන් හරහා බලය මාරු කිරීම ඉතා දුෂ්කර වන අතර එමඟින් ඇතිවන ප්‍රතිවිපාකයන් අත්විඳීමට සිදුවන්නේ සමස්ථ ප්‍රජාතන්ත්‍රවාදී ප්‍රවාහයටමය.

බලයෙහි සිටින දේශපාලන පක්ෂ සහ දේශපාලඥයින් විසින් රජ්‍ය දේපළ අවභාවිතා කිරීමට හැකි මාර්ගයන් සොයා ගැනීමට බොහෝ විට උත්සුක වේ. රාජ්‍ය දේපළ යනු මුදල් පමණක්ම නොවේ. ඒ තුලට රාජ්‍ය මාධ්‍ය හා නිලධාරින් ආදිය ද ඇතුලත් ආයතනික සම්පත් ද මෙන්ම සන්නිවේදන මෙවලම් ද ඇතුලත් වේ. රාජ්‍ය මාධ්‍යන්හි පක්ෂග්‍රාහීත්වය වූ කලී බොහෝ රටවල අවභාවිතයට පාත්‍රවන සුලබ ක්ෂේත්‍රයකට නිර්දේශනයකි. බලයේ සිටින පාලකයින් විසින් ඒවායේ ක්‍රියාකාරීත්වය පාලනය කෙරෙන පරිදි විවිධාකාර රෙගුලාසි සහ නීති අනුමත කර ගැනීම සඳහා ඔවුන්ට හිමි බලාධිකාරය ද භාවිතා කරනු ලබයි. මෙලෙස සිදු කළ හැකි රෙගුලාසිමය පරමාධිකාරීය තුලට අපරාධ නඩුවිධාන සංග්‍රහය වෙනස් කිරීමේ සිට මැතිවරණ අපේක්ෂකයින්ගේ නම් ඡන්ද පත්‍රිකාව තුළ දිස්වන ආකාරය සහ අනු පිළිවෙළ තීරණය කිරීම දක්වා වූ ඕනෑම ආකාරයකින් භාවිතා විය හැකිය. සමහර අවස්ථාවන්හී දී බලයේ සිටින පාලකයින් විසින් සිය විරුද්ධ පාක්ෂික නායකයින්ට මැතිවරණයට ඉදිරිපත් වීමට ඇති ඉඩකඩ පවා අහිමි කරනු ලබන තත්ත්වයක් තිබේ. අවසාන වශයෙන් බලයේ සිටින පාලකයින් විසින් ආරක්ෂක අංශ සහ නීතිය ක්‍රියාත්මක කිරීමේ ආයතන හරහා තමන් සතු බලාත්මක කිරීමේ සම්පත් අවභාවිතා කරමින් නීති සහ රීති ක්‍රියාත්මක කිරීමට පවා ඉදිරිපත් වේ. මහජන රැලි පැවැත්වීමට විරුද්ධ පක්ෂයට ඇති අයිතිය ප්‍රතික්ෂේප කිරීම හෝ විරුද්ධ පාක්ෂික දේශපාලනඥයින් ක්‍රියාකාරකයින් හෝ මූල්‍යාධාර සපයන්නන් හිරිහැරයට ලක් වීමට පසුබිම සැකසීම ආදිය බොහෝ රටවල් තුළ දැකිය හැකි අවභාවිතාවන් අතර ප්‍රධාන තැනක් ගනී.

අවභාවිතා කිරීමේ ආකාරයන් බොහෝමයක් ඇති අතරම, එකී ක්‍රියාකාරකම් නියාමනය කිරීම තුලින් ඒවා කෙරෙහි ප්‍රතිවිරෝධයන් දැක්වීම සඳහා ක්‍රමවේදයන් ද තිබේ. මෙකී ක්‍රමවේදයන් පහත සඳහන් පරිදි පෙළගැස්විය හැකිය.

- ✓ කිසිදු දේශපාලන ක්‍රියාකාරයෙකුට පක්ෂග්‍රාහී ලෙස හෝ අවාසිදායක ලෙස රාජ්‍ය ආයතනයක් මගින් කටයුතු කිරීම තහනම් කිරීම.
- ✓ රාජ්‍ය ආයතනයන් මගින් ක්‍රියාකාරන යම්යම් ආකාරයන් තහනම් කිරීම (සියලුම අවස්ථාවන්හි හෝ මැතිවරණ ව්‍යාපාරයක් ක්‍රියාත්මක වන වකවානුවකදී හෝ මැතිවරණ ව්‍යාපාරයක් අතරතුර දියත් කෙරෙන සංවර්ධන කටයුතු වලදී)
- ✓ රාජ්‍ය ආයතනයන් තුලින් දේශපාලන ක්‍රියාකාරයන්ට සහයෝගය ලැබීම තහනම් කිරීම

දේශපාලන පක්ෂ සහ මැතිවරණ ව්‍යාපාරයන් සඳහා නියාමනය කරන ලද රාජ්‍ය අරමුදල් ලැබීම පිළිගත හැකි තත්ත්වයක් මෙන්ම එතුලින් බලයේ සිටින්නන් සඳහා එනයින්ම ලැබෙන වාසිසහගත තත්ත්වය අඩු කිරීමට හේතුවන්නා සේම එසේ අරමුදල් ලබාදීමේදී විරුද්ධ පාක්ෂිකයින්ට අවාසියක් හෝ වෙනස් කොට සැලකීමත් නොවන පරිදි සාධාරණ පදනමක් මත සිදු කළ යුතුවේ.

රාජ්‍ය දේපළ අවභාවිතා කිරීම වූ කලී දේශපාලන මූල්‍යකරණය තුළ දැකිය හැකි සුලබ සහ විනාශකාරී අංගයකි. විධිමත් නියාමනයන් තුලින් පමණක් මෙකී තත්ත්වය ඵලදායී ලෙස ආමන්ත්‍රණය කිරීම දුෂ්කර කාරණයකි. රාජ්‍ය දේපළ අවභාවිතා කිරීමට ප්‍රතිවිරෝධය පෑමට නම් දේශපාලන මූල්‍යකරණය සුපරීක්ෂණ ආයතනයන්හි බලාත්මක වීම මෙන්ම සිවිල් සමාජයෙහි සහ මාධ්‍යයන් මගින් නිරන්තර අවදියෙන් සිටීම ද අවශ්‍ය වේ. අවසානාත්මක වශයෙන් රාජ්‍ය දේපළ අවභාවිතය සහමුලින්ම නැති කර දැමීමට නම් එවැනි ක්‍රියාකාරකම් වල නියැලෙන දේශපාලන පක්ෂ එකී කටයුතු වලින් පූර්ණ වශයෙන් ඉවත් විය යුතුය.

## දේශපාලන මූල්‍යකරණය හා බැඳි විධිමත් නියාමනය

*"දූෂණය බහුලව ඇති රාජ්‍යක, නීති බොහෝමයක් තිබිය යුතු වේ"*

ටැසිටස් (රෝමානු ඉතිහාඥයෙකු, කිස්තු වර්ෂ 15-120)

දේශපාලන මූල්‍යකරණය හා සම්බන්ධ නුසුදුසු හැසිරීම පිළිබඳව කටයුතු කිරීම සඳහා වඩාත් සුදුසුම ක්‍රමවේදය වන්නේ නීති සහ රෙගුලාසි සම්මත කිරීමයි. හෙළිදරව් කිරීම සම්බන්ධයෙන් වන රෙගුලාසි මගින් අපේක්ෂා කරනු ලබන්නේ විනිවිදභාවය සහතික කිරීමය(මූල්‍ය වාර්තා කරණය). යම් යම් තහනම් කිරීම්ම සහ සීමා කිරීම් තුලින් ඍජුවම අපේක්ෂා කරනු ලබන්නේ යම් යම් හැසිරීම් බැහැර කිරීමය. රාජ්‍ය අරමුදල් ලබාදීම තුලින් අපේක්ෂා කරනු ලබන්නේ දේශපාලන පක්ෂ සහ අපේක්ෂකයින් පුද්ගලික අංශයෙහි මුදල් මත යැපීම වලක්වාලීමය. දේශපාලන මූල්‍ය කරණය නියාමනය කලහැකි වෙනත් ආකාරයෙහි තත්ත්වයන් ද තිබේ. රාජ්‍ය දේපළ සහ රාජ්‍ය මාධ්‍ය අවභාවිතාව සම්බන්ධයෙන් වන රෙගුලාසි සහ නිල මැතිවරණ ව්‍යාපාර කාල පරාසයක් ස්ථාපිත කිරීම මගින් මැතිවරණ ව්‍යාපාරයට අදාළ මුදල් වියදම් කිරීමට හැකි කාලය සීමා කිරීම නිදසුන් කිහිපයක් ලෙසට දැක්විය හැකිය.

කවර රීතියක් තෝරාගනු ලැබුවද, ඒවා ඒ ඒ රටෙහි පවතින තත්ත්වයන්ට සහ ඒ ඒ රටට ළඟාකරගත යුතු ඉලක්කයන්ට ගැලපිය යුතුය.

## හෙළිදරව් කිරීම/ අනාවරණය කිරීම

දේශපාලන මූල්‍යකරණය ඵලදායී ලෙස පාලනය කිරීම සම්බන්ධයෙන් ගත්කළ විශේෂයෙන්ම මහජන නිලධරයන් සඳහා වන දේශපාලන පක්ෂ සහ අපේක්ෂකයින් ද ඇතුළුව දේශපාලන ක්‍රියාකාරීන්ගේ මූල්‍ය තත්ත්වය පිළිබඳව තොරතුරු ලබා ගැනීමට ඇති හැකියාව මූලික අංගයක් ලෙසට සැලකේ. එකී මූලික කාරණය පිළිබඳ නිසි දැනුමක් නොමැතිව, අනෙකුත් නියාමන රෙගුලාසින්ට ගරු කිරීම පිළිබඳව සලකා බැලීම බොහෝවිට දුෂ්කර වූත් කල නොහැකි වූත් කාරණයක් බවට පත්වේ.

**රූප සටහන 3: විවිධ කාලයන්හි හෙළිදරව් කිරීම/ අනාවරණය කිරීම පිළිබඳ අවශ්‍යතාවයන්**

| කලාපය | දේශපාලන පක්ෂ (වාර්ෂිකව/මැතිවරණ සම්බන්ධයෙන්) | අපේක්ෂකයින් |
|---|---|---|
| අප්‍රිකාව | 70%/54% | 54% |
| ඇමරිකාව | 60%/59% | 53% |
| ආසියාව | 87%/41% | 71% |
| යුරෝපය | 93%/73% | 77% |
| මැදපෙරදිග සහ උතුරු අප්‍රිකාව | 75%/9% | 45% |
| ලෝකය | 75%/55% | 64% |

දූෂණයට එරෙහි එක්සත් ජාතීන්ගේ සම්මුතිය මගින් දේශපාලන මූල්‍යකරණයෙහි විනිවිදභාවය පිළිබඳව තත්ත්වයක් ස්ථාපිත කර ඇති අතර, එතුලින් ප්‍රකාශ කෙරෙන පරිදි, අවශ්‍ය අවස්ථාවන්හිදී දේශපාලන පක්ෂයන්හි ද, මහජන නිලයන්ට තේරී පත් වන අපේක්ෂකයින්ගේද අරමුදල් පිළිබඳ ඇති විනිවිදභාවය ඉහල නැංවීම සඳහා සියලු රටවල් මගින් ඉහත කී සම්මුතියෙහි අරමුණු කලා වූ ප්‍රතිපාදනයන්ට අනුකූල වන ලෙස සුදුසු ව්‍යවස්ථාපිත සහ පරිපාලනමය පියවරයන් ගතයුතුය. [1]

කෙසේ නමුත් සියලු රටවල් මගින් ඉහත කී අන්දමේ ප්‍රතිපාදන ඇතුළත් රෙගුලාසි හඳුන්වාදී නොමැත.



[1] දූෂණයට එරෙහි එක්සත් ජාතීන්ගේ සම්මුතිය. 7 (3) වගන්තිය

ඉහත රූපසටහන 3 මගින් පෙන්නුම් කෙරෙන්නේ ලෝකයෙහි විවිධ කලාපයන්හි කොතරම් ප්‍රමාණයක රටවල් සංඛ්‍යාවක් පිළිවෙලින් දේශපාලන පක්ෂ සහ අපේක්ෂකයන් සඳහා විධිමත් මූල්‍ය වාර්තාකරණයක අවශ්‍යතාවය ඇති කර තිබේද යන්නය (වර්ෂ 2016 මුල් භාගයෙහි දත්ත). වාර්තා ඉදිරිපත් කිරීමේ අවශ්‍යතාවය දක්වන රීතීන් තිබූ පමණින් ඉදිරිපත් වූ වාර්තා වල තොරතුරු නිවැරදි බවට හෝ ඒවා සැලකිලිමත් ලෙස විගණනය කළ බවට අදහස් නොවේ.

දේශපාලන ක්‍රියාකරුවන් සඳහා වන තොරතුරු හෙළිදරව් කිරීමේ/අනාවරණය කිරීමේ ක්‍රමවේදයක් නිර්මාණය කිරීමේ දී සැලකිල්ලට භාජනය කළ යුතු කරුණු රාශියක් තිබේ. ඒ ඒ ක්‍රමවේදයන් අදාළ රටේ දේශපාලන, ආර්ථික හා සමාජ තත්ත්වයන්ට ගැලපෙන පරිදි විය යුතුවේ. නිදර්ශනයක් ලෙස, යම් රටක බැංකු ක්‍රමවේදය කෙතරම් දුරට ස්ථාපිත වී තිබේද යන්න සහ මැතිවරණ අපේක්ෂකයින්ට සහ දේශපාලන පක්ෂ සඳහා එකී ක්‍රමවේදයන්ට කෙතෙක් දුරට අනුගත විය හැකිද යනාදී තත්ත්වයන් සලකා බැලිය යුතු සේම අදාළ පාර්ශවකරුවන්ට එකඟ වීමට නොහැකි තරමට සංකීර්ණ වූ මූල්‍ය වාර්කාකරණ රීති නොපැවතිය යුතුය. [2]

මෙහිදි එක් විවාදිත කරුණක් වන්නේ මහජනයාට අනාවරණය කිරීම හේතුවෙන් විරුද්ධ පාක්ෂික දේශපාලන පක්ෂ සඳහා සහ අපේක්ෂකයින් සඳහා අරමුදල් සැපයීමට අඩු කැමැත්තක් ආධාර ලබාදෙන කණ්ඩායම් තුලින් දිස්විය හැකිවීම සහ එතුලින් බලයේ සිටින්නන් හට වැඩි වාසි සහගත තත්ත්වයක් උද්ගත වීමයි. මෙහිදී යම් ඡන්ද කොට්ඨාශයක නියෝජිතයින් ලෙස පත්වීමට සිටින අපේක්ෂකයින් කවර ආකාරයෙහි මූල්‍ය ගනුදෙනු වලට සම්බන්ධ වේද යන්න පිළිබඳ ඡන්දදායකයින්ට ඇති දැන ගැනීමේ අයිතිය සලකා බැලිය යුතුවේ.

**දායකත්වය සහ වියදම් මත සීමාවන් සහ තහනම් කිරීම්**

දේශපාලන පක්ෂ සහ අපේක්ෂකයින්ට සම්බන්ධ මූල්‍ය තත්ත්වයන් විවෘත සහ විනිවිදභාවයකින් යුක්ත තාක් දුරට වෙනත් නියාමනයන් අවශ්‍ය නොවන්නේය යන තර්කය සමහර අවස්ථාවන්හිදී ඉස්මතු කර දැක්වේ. අදාළ මැතිවරණ කොට්ඨාශයෙහි ඡන්දදායකයින්ට ලබාගත හැකි තොරතුරු යන්න සංකල්පයක් ලෙසට මෙයින් අදහස් කෙරේ. නිදසුනක් ලෙස යම්කිසි දේශපාලන පක්ෂයක් ත්‍යාග ලබා දීම සඳහා විශාල වශයෙන් මුදල් වියදම් කරනු ලබන්නේ නම්, එකී ඡන්ද කොට්ඨාශයෙහි ඡන්දදායකයින් එකී පක්ෂය අනාගතයේදී නැවත පත්කර ගැනීම ප්‍රතික්ෂේප කරනු ඇත.



[2] ඉන්ටර්නැෂනල් අයිඩියා ආයතනයෙහි දත්ත (2012) "පරිශීලන මූලාශ" බලන්න.

**රූප සටහන 4: දායකත්වයන් සහ වියදම් මත සීමාවන් සහ තහනම් කිරීම**




කෙසේ නමුත්, එවැනි ප්‍රවේශයක් සියලු අවස්ථාවන්හිදී සාර්ථක විය නොහැකි බවද සලකා බැලිය යුතු කරුණකි. අරමුදල් සඳහා ඇති ප්‍රවේශයෙහි පරතරය විශාල වන අවස්ථාවන්හි දී හෝ මාධ්‍ය නිදහස සම්පූර්ණ වශයෙන් නොමැති කල්හි, දේශපාලන මූල්‍යකරණය පිළිබඳ සියලු තොරතුරු මැතිවරණ කොට්ඨාශයක් වෙත ලඟාවීමේ දුෂ්කරතාවයන් තිබිය හැකිය. එවැනි පසුබිමක් තුල ලබාගත හැකි තොරතුරු පිළිබඳ කාරණය පමණක් නොව, දේශපාලන පක්ෂයන්ගේ සහ අපේක්ෂකයින්ගේ හැසිරීම පාලනය කරනු ලබන නියාමන ක්‍රමවේදයන්ගේ අවශ්‍යතාවය ද මතු වේ.

අහිතකර හැසිරීම් සහිත ක්‍රියාකාරකම් සඳහා ප්‍රතිවිරෝධය පෑමේ එක් ක්‍රමයක් වන්නේ, තහනම් පැනවීමය. මෙලෙස වන තහනම් කිරීම් තුලින් දේශපාලන ක්‍රියාකරුවන් නුසුදුසු මූලාශ්‍රයන් තුලින් එනම් විදේශ අරමුදල් ලබාගැනීම වැනි මාර්ගයන්ගෙන් මුදල් ලබා ගැනීම වලකාලිය හැකිය. දේශපාලන මූල්‍යකරණය පිළිබඳ ඉන්ටනැෂනල් අයිඩියා (International IDEA) ආයතනය සතු දත්ත තොරතුරු අනුව, දත්ත තොරතුරු ලබාගත හැකි රටවල් 169 ක් අතුරෙන් සියයට 67 ක්ම විදේශ මූලාශ්‍රයන් තුලින් මුදල් ලබාගැනීම තහනම් කර තිබේ.[3] මැතිවරණ ව්‍යාපාරයන්ට දායකත්වය ලබාදීම යන කාරණයේදී සමහර රටවල් මගින් සමාගම් වලට එලෙස කිරීම තහනම් කර තිබේ. මේ සඳහා සාමාන්‍යයෙන් ඉදිරිපත් කරනු ලබන හේතුව වන්නේ දේශපාලඥයින්ගේ ක්‍රියාකාරකම් සඳහා අයථා ලෙස බලපෑම් කිරීමේ හැකියාවක් සමාගම් වලට ඇති බවයි. වර්ෂ 2016 දී, තොරතුරු ලබා ගත හැකි රටවල් 170 ක් අතුරෙන් සියයට 27 ක් මෙලෙස සමාගම් වලින් දායකත්වය ලබා ගැනීම තහනම් වූ කලී රාජ්‍ය දේපළ අවභාවිතා කිරීමට ප්‍රතිවිරෝධය පෑමේ එක් ක්‍රයවේදයකි.



[3] ඉන්ටර්නැෂනල් අයිඩියා ආයතනයෙහි දත්ත (2012) පරිශීලන මූලාශ බලන්න. එක්තරා විටෙක විවාදිත කරුණක් වන්නේ, විදේශයන්හි වෙසෙන පුරවැසියන් ඔවුන්ගේ රටේ මැතිවරණ ව්‍යාපාරයන්ට දායකත්වයන් දැක්වීමට ඉඩ ලබාදිය යුතුද යන්නයි. මෙය සාධාරණ මූලධර්මයක් වුවද, බොහෝවිට විදේශයන්හි සිටින පුරවැසියන්ට තමන්ගේ රටේ මැතිවරණයන්හි දී ඡන්දය භාවිතා කිරීමට ඉඩකඩක් බොහෝ රටවල නොමැත. එනිසා විදේශයන්ගෙන් ලැබෙන මුදල් අදාළ රටේම පුරවැසියන්ගේද එසේත් නැතිනම් වෙනත් විදේශ ලැදියාවක් පදනම් කරගෙන ලැබෙන්නේ ද යන්න තහවුරු කරගැනීම ඉතා දුෂ්කරය.

බොහෝ රටවල් තුළ නිර්නාමික දායකත්වයයන් තහනම් කර ඇත්තේ ඒවාට ඉඩ ලබා දුන්නොත් එලෙස ලැබෙන දායකත්වයන් තහනම් කළ, එනම් සමාගම් හෝ විදේශ අරමුදල් ආදී මූලාශයන්ගෙන් ලැබෙන්නේද යන්න තහවුරු කර ගැනීම ඉතා දුෂ්කර කාරණයක් වන නිසාවෙනි. ඉන්ටර්නැෂනල් අයිඩියා දත්ත තොරතුරු වලට අනුව තොරතුරු ලබාගත හැකි රටවල් 164 ක් අතුරෙන් සියයට 70 ක් තුලම නිර්නාමික දායකත්වයන් මත පූර්ණ තහනමක් හෝ සීමිත තහනමක් පනවා ඇත්තේ එය දායකත්ව තහනම් කිරීම් අතර සුලබම සාධකයක් බවට පත් කරමිනි.

වියදම් කිරීම් සම්බන්ධයෙන් පවතින තහනම් කිරීම තුලින් ඡන්ද මිලදී ගැනීම හෝ මැතිවරණ නිලධාරීන්ට අල්ලස් ලබා දීම ආදී අවකල්ක්‍රියාවන් වැලැක්වීම ඉලක්ක කර තිබේ. කෙසේ නමුත්, සමහර රටවල්හි මැතිවරණ තරඟ බිම තුළ යම් තුලිත පසුබිමක් සැකසීම උදෙසා පුද්ගලික ප්‍රචාරණයටද තහනම් පනවා තිබේ. මුද්‍රිත හා විද්‍යුත් මාධ්‍යයන් වෙත නිදහස් හා සමාන ප්‍රවේශයක් ලබා ගැනීමේ තත්ත්වයද සමඟ ගත්කළ ප්‍රචාරණය සම්බන්ධයෙන් පනවනු ලබන තහනම් කිරීම් තුලින් සමහර අවස්ථාවන්හිදී ධනවත් මැතිවරණ තරඟකරුවන්ට ඇති අසීමිත වාසිසහගත තත්ත්වයන්ට යම් සීමාවක් පැනවීමට අපේක්ෂා කෙරේ. කෙසේ නමුත් එවැනි සීමා කිරීමේ රීතීන් තුළින් කතා කිරීමේ නිදහසට බාධාවක් වන බවට විවේචනයක් ද පවතී.

යම්යම් අවස්ථාවන්හි දී විවිධ ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් පූර්ණ තහනම් කිරීමක් පැනවීම වෙනුවට විවිධ රටවල් මගින් යම් සීමාවන් පැනවීමේ තත්ත්වයක් දැකිය හැකිය. පුද්ගලයින්ට සහ සමාගම් වලට මැතිවරණ ක්‍රියාකාරකම් සඳහා දායකත්වයන් ලබාදිය හැකි ප්‍රමාණයෙහි යම් යම් සීමාවන් පැනවීම තුලින් සමහර රටවල් අපේක්ෂා කරනු ලබන්නේ එවැනි විශාල පරිත්‍යාගයන් කරන්නන් තුලින් දේශපාලන තීරණ වලට එල්ල විය හැකි බලපෑම් අවම කර ගැනීමයි. එවැනි සීමාවන් පැනවීමේ දී, දේශපාලන පක්ෂ සහ අපේක්ෂකයින්ට ද තමන්ගේ මැතිවරණ ව්‍යාපාර කටයුතු සඳහා අරමුදල් එක්රැස් කර ගැනීමට පුළුල් ජනතා පදනමක් වෙත ප්‍රවේශ වීමට සිදු වන අතර එතුලින් බහුතරයක් ජනතාව දේශපාලනික ක්‍රියාකාරකම් වලට දායකවේය යන වෙනසටද මඟ පැදිය හැකිය.

දේශපාලන පක්ෂ සහ අපේක්ෂකයින් විසින් කෙතරම් මුදල් ප්‍රමාණයක් වියදම් කළ හැකිද යන්න මත පවා සීමාවන් පැනවිය හැකිය. බොහෝමයක් රටවල් තුළ, එවැනි සීමා පැනවීම තුළින් ධනවත් සහ එසේ නොවන මැතිවරණ තරඟකරුවන් සඳහා සමාන තරඟ බිමක් සැකසීම යන ඉලක්කය පවතින අතරම සමස්ථයක් ලෙස මැතිවරණ ව්‍යාපාරය තුළ කෙරෙන වියදම් ප්‍රමාණයෙහි යම් සීමා කරීමක් ද අපේක්ෂා කරනු ලැබේ. ඒ මන්ද යත්, යම් යම් රටවල් ජාතික ආර්ථිකය හෝ දුගී බවේ ප්‍රමාණය ආදිය සලකා බැලීමේදී එලෙස යම් සීමා කිරීමක් පැවතීම පොදු යහපතට හේතු වේ. ඉන්ටර්නැෂනල් අයිඩියා ආයතනයෙහි දේශපාලන මූල්‍යකරණය සම්බන්ධයෙන් ඇති දත්ත තොරතුරු වලට අනුව, සියයට 30 ක පමණ ප්‍රමාණයක රටවල් සංඛ්‍යාවක් දේශපාලන පක්ෂයන්හි වියදම් කිරීමේ සීමාවල් පනවා ඇති අතර

සියයට 45 ක පමණ රටවල් ප්‍රමාණයක් මැතිවරණ අපේක්ෂකයින්ගේ වියදම් කිරීම් සම්බන්ධ සීමා පනවා තිබේ.

දේශපානයෙහි මූල්‍යකරණය පාලනය කිරීම සඳහා වන එක් ක්‍රමවේදයක් ලෙසට දායකත්වයන් සහ වියදම් කිරීම මත සීමාවන් සහ තහනම් කිරීම් පැනවීම පෙන්වාදිය හැකිය. කෙසේ නමුත්, එවැනි ක්‍රමවේදයන් හඳුන්වාදීම වඩාත් සාර්ථක වන්නේ එලෙස වන්නා වූ තහනම් කිරීම් සහ සීමාවන් උල්ලංඝණය කරනු ලබන්නා වූ විට එවැනි ක්‍රියාකාරකම් හඳුනාගෙන ඒවාට දඬුවම් පැමිණවීමේ විධිමත් ඵලදායී හෙලිදරව් කිරීමේ/අනාවරණය කිරීමේ ක්‍රමවේදයක පැවැත්ම ඇති තාක් දුරට පැමිණි. ඉහත කී සීමාවන් උල්ලංඝණය කිරීමේ දී දඬුවම් ලැබේය යන හැඟීම ඇති නොවන තාක් දුරට හුදෙක් සීමාවන් පැනවීම තුලින් කිසිදු යහපත් ප්‍රතිඵලයක් ලඟාකරගත නොහැකි වනු ඇත.[4]

දේශපාලන පක්ෂ හා මැතිවරණ අපේක්ෂකයින්ගේ රාජ්‍ය අරමුදල් ඉහතින් සාකච්ඡා කළ නියාමනයන් තුලින් පෙන්නුම් කරන ලද්දේ යම් නිශ්චිත ක්‍රියාකාරකම් සමුදායක් වලකාලීමට හෝ ඒ සඳහා දඬුවම් දීමට කෙරෙන උත්සාහයක් වශයෙනි.[5] මෙම ලියවිල්ලෙහි, හැඳින්වීමේ දී පෙන්වා දුන් පරිදි, මුදල් යනු දේශපාලනයෙහි අවශ්‍ය කාරණයක්ය යන්න මෙහිදි අප විසින් හඳුනා ගත යුතු අතර රාජ්‍ය අයවැය තුළින් "පිරිසිදු" හෝ "නියාමනය කරන ලද" රාජ්‍ය අරමුදල් ලබාදීමෙන් දේශපාලනයෙහි මුදල් මඟින් විය හැකි අගතිගාමී ප්‍රතිඵල අඩු කිරීමට හේතු වන අතර එහිදී සාරවත් සංවාදයක් සහ තරඟයක් ඇති වීමට කිසිදු බාධාවක් ද උද්ගත නොවිය යුතුය.

දේශපාලන පක්ෂ වලට සහ (එතරම් සුබල නොවන ලෙස) මැතිවරණ අපේක්ෂකයින්ට රාජ්‍ය අරමුදල් මඟින් මුදල් ලබාදීම වර්ෂ 1920 ගණන් වලදී ලතින් ඇමරිකානු රටවල් තුළින් දැකිය හැකි වූ අතර එය 1960 ගණන් වලදී යුරෝපය තෙක් ව්‍යාප්ත විය. එකී තත්ත්වය අදවන විට ලෝකයෙහි රටවල් සියල්ල අතුරෙන් 3/2 ක පමණ ප්‍රමාණයක ක්‍රියාත්මක වේ.

රාජ්‍ය අරමුදල් ලබාදීම සම්බන්ධයෙන් සහයෝගය දක්වන්නන් ප්‍රකාශ කරනු ලබන්නේ එතුලින් සමාන තරඟ බිමක් ස්ථාපිත කරන්නා සේම නව දේශපාලන බලවේගයන් යම් හඬක් නැඟීමට හේතුපාදක වන බවයි. ඔවුන් තවදුරටත් පෙන්වා දෙනු ලබන්නේ, එතුලින් දේශපාලඥයින් විසින් නීති විරෝධී පරිත්‍යාග ලබා ගැනීමට හෝ රාජ්‍ය දේපළ අවභාවිතා කිරීමට පෙළඹීමේ හැකියාවද අවම කෙරෙන බවයි.



[4] වියදම් සීමාවන් සම්බන්ධයෙන් අනුගත වීම සඳහා වඩාත් ඵලදායී ක්‍රමය වන්නේ කිසිවෙකුටත් ලඟා විය නොහැකි තරමේ ඉහල වියදම් සීමා පැනවීමයි. කෙසේ නමුත්, එතුලින් නියාමනය කිරීමේ සෑම අරමුණක්ම බැහැර කෙරේ.

[5] මේ පරිච්ඡේදය තුළින් අවධානයට ලක් කෙරෙන්නේ දේශපාලන මූල්‍යකරණ නියාමනය කිරීමේ දී රාජ්‍ය අරමුදල්, ගෝලීය අත්දැකීම් (2009) සහ දැනට සිදු කෙරෙන පර්යේෂණ.

රාජ්‍ය අරමුදල් ලබාදීම සම්බන්ධයෙන් විවේචන ඉදිරිපත් කරන්නන්ගේ අදහස වන්නේ එතුලින් දේශපාලඥයින් සහ ආධාරකරුවන් අතර සම්බන්ධය අඩු කිරීමට එය හේතු වන බවත් එහිදී දේශපාලන පක්ෂ සමාජයෙහි කොටසක් නොව රජයේ කොටස්කරුවකු බවට පරිවර්තනය වීමේ අවධානමක් පවතින බවයි. ඔවුන් තවදුරටත් පෙන්වා දෙන්නේ එවැනි රාජ්‍ය අරමුදල් ලැබීමක ප්‍රයෝජනය දැනට නියෝජනයක් සහිත දේශපාලන පක්ෂ වලට පමණක් ලැබේ නම්, එහි දී නව දේශපාලන පක්ෂ සඳහා තරග කිරීමට ඇති දුෂ්කරතාවය තවදුරටත් වැඩි කරන බවයි.

රාජ්‍ය අරමුදල් සැපයීමේ ක්‍රමවේදයක් සැකසීමේ දී අවධානය යොමුකළ යුතු කරුණු කාරණා බොහෝමයක් පවතින අතර එවැන්නකින් පහතින් සඳහන් මූලිකාංග දිස්විය යුතු වේ.

- සුදුසුකම් ලැබීමේ සීමාවන් (අරමුදල් සඳහා සුදුසු වන්නේ කව්රුන්ද)
- මුදල් වෙන් කිරීමේ නිර්ණායක (සුදුසුකම් ලබන සියලුදෙනාට සමාන අරමුදල් ප්‍රමාණයක් ලැබිය යුතුද එසේත් නොමැති නම්, මහජන කැමැත්ත යන සාධකය මත අරමුදල් ප්‍රමාණය තීරණය කිරීමට ප්‍රතිපාදන තිබිය යුතුය)
- සහයෝගය ලබාදෙන කාලසීමාව (මැතිවරණයට පෙර හෝ පසු හෝ වාර්ෂිකව)
- රාජ්‍ය සහයෝගය ලබාදීමේ ස්වරූපය (මුදල් හෝ බදු සහන වැනි වක්‍ර අරමුදල් හෝ මාධ්‍යට ඇති ප්‍රවේශය)

## බලාත්මක කිරීම

*"රීති බොහෝමයක් අවම බලාත්මක කිරීමක් "*[6]
මයිකල් පින්ටෝ - ඩුචින්ස්කි (දේශපාලන මූල්‍යකරණ විද්වතෙකු)


මේ වන තෙක් සාකච්ඡා කළ විධිමත් නියාමනය කිරීම් මගින් දේශපාලනයෙහි මුදල් භාවිතය තුලින් උද්ගත විය හැකි අහිතකර බලපෑම් කෙරේ යම් ප්‍රතිවිරෝධයක් ඇති කළ හැකිය. කෙසේ නමුත්, එය යථාර්තයක් බවට පත් වන්නේ එකී නියාමන රෙගුලාසි ප්‍රයෝගිකව නිසි පරිදි ක්‍රියාත්මක වන්නේ නම් පමණි. හෙළිදරව් කිරීම/අනාවරණය කිරීම අවශ්‍ය සේම, දේශපාලන මූල්‍යකරණයෙහි විනිවිදභාවය ලඟා කර ගැනීම උදෙසා ඒවා පමණක් ප්‍රමාණවත් නොවේ.

බලාත්මක කිරීම වූ කල දැනට ඉස්මතු වන ප්‍රජාතන්ත්‍රයන් තුළ පමණක් නොව, පොදුවේ ගත්කළ සෑම තැන්හිම පවතින ගැටළුවක් බවට පෙන්වාදීම ඉතා වැදගත් වේ.



[6] පින්ටො, ඩචින්ස්කි, මයිකල් ප්‍රජාතන්ත්‍රවාදය වැදගත් ලෙස සැලකීම ග්‍රන්ථමාලා අංක 1 පොදු රාජ්‍ය මංඩලයේ දේශපාලන මූල්‍යකරණය පොදු රාජ්‍ය මංඩලීය ලේකම් කාර්යාලය, ලන්ඩන්, 2001 පිටුව 25.

**රූප සටහන 5: බලාත්මක කිරීමේ ව්‍යුහය**




වර්ෂ 2009 IFES ප්‍රකාශනයක් වන දේශපාලන මූල්‍යකරණය නියාමනය කිරීම ගෝලීය අත්දැකීම් නම් වූ ප්‍රකාශනයෙහි දී හානි හයිනුල්බායි විසින් දේශපාලන මූල්‍යකරණය බලාත්මක කිරීමට සහ සුපරීක්ෂණයට සම්බන්ධ ප්‍රයෝගික විසඳුම් නම් වූ පරිච්ඡේදයෙහි පෙන්වාදෙන ආකාරයට "ශක්තිමත් ආයතනයන් සහිත ක්‍රමවේදයන් තුලදී නීතිය මඟ හැරීමට දේශපාලන ක්‍රියාකාරීන් අති දක්ෂය. ද්වි ගණනය සහ ස්වාධීන වියදම් කෙරේ විශ්වාසය තැබීම ආදී තාක්‍ෂණික ක්‍රම භාවිතය ප්‍රකට කරුණකි"[7]

එලදායී බලාත්මක කිරීමක් උදෙසා ඉදිරිපත් කළහැකි මූලිකම නිර්දේශයක් වන්නේ අදාළ වගකිව යුතු ආයතනය සතුව නිසි බලයක් සහ පවතින නියාමන රෙගුලාසි ක්‍රියාත්මක කරමින් ඒවා උල්ලංඝණය කිරීමේ තත්ත්වයන් වැලක්වීමේ ධාරිතාවයක් තිබිය යුතු වීමය. බොහෝ රටවල් හි දේශපාලන මූල්‍යකරණය පිළිබඳ සුපරීක්‍ෂණ කිරීමේ වගකීම මැතිවරණ කළමණාකරන ආයතනය සතුව ඇති නමුදු, එලෙස වන්නා වූ සුපරීක්‍ෂණ ආයතනය දේශපාලන පක්‍ෂ සඳහා වූ කොමිසමක්, විගණන ආයතනයක් හෝ අධිකරණයක් ද විය හැකිය.

කවර ආකාරයෙන් සැඳුම්ලත් ආයතනික ව්‍යුහයක් වුවද එලෙස නිර්මාණය වන්නා වූ සුපරීක්‍ෂණ ආයතනයකට ජ්‍යෙෂ්ඨ දේශපාලඥයින්, පාලන බලයේ සිටි දේශපාලන පක්‍ෂය සහ බොහෝ විට රාජ්‍ය නායකයින් ආදී පුද්ගලයින් සහ ආයතන සුපරීක්‍ෂණයට ලක්කිරීමට සිදුවේ. එහි ප්‍රතිඵලයක් ලෙස මෙවන් ආයතනයකට අදාළ මූල්‍ය වාර්තා ඉතා සූක්‍ෂම ලෙස විමර්ෂණයට ලක් කිරීමට ඉඩකඩ ලබා නොදෙන අන්දමේ පීඩනයක් එල්ල විය හැකිය. දේශපාලන මූල්‍යකරණය සුපරීක්‍ෂණයට ලක්කිරීමේ කාර්යයෙහි නියැලී සිටින පුද්ගලයෙකුට එකී කාර්යය ඉතා බරපතල ලෙස සිදු කිරීමෙන්ම ඔහුගේ රැකියාවටද තර්ජනයක් එල්ල විය හැකිය.



[7] ඔමන්, මැග්නස් සහ සයිනුල්බායි, හනි. දේශපාලන මූල්‍යකරණය නියාමනය කිරීම, ගෝලීය අත්දැකීම් මැතිවරණ ක්‍රමවේදයන් සඳහා වන අන්තර්ජාතික පදනම. වොෂින්ටන්, 2009.


එවැනි ආයතනයන්හි ප්‍රධානීන් පත් කිරීමේ ව්‍යුහය ඉතා ඉහළ වැදගත්කමක් තිබෙන කාරණයක් වන අතර ඒවායෙහි අයවැය තත්ත්වයන් පාලනය කිරීමේ හැකියාව එකී ආයතනයන් සතුව තිබිය යුතුය.

මෙකී ක්‍රමවේදය වඩාත් ඵලදායී වීම සඳහා අදාළ ක්‍රියාත්මක කිරීම් සිදුකරනු ලබන ආයතනයට ඵලදායී ලෙස දඬුවම් පැමිණවීමේ කාර්යය කෙරේ ද ප්‍රවේශයක් තිබිය යුතුවේ. එනම්, මූල්‍ය වාර්තා ඉදිරිපත් කිරීම ප්‍රමාද කිරීම් ආදියෙහිදී සුළු පරිපාලමය දඬුවම් හි සිට දේශපාලන පක්ෂ සහ අපේක්ෂකයින් මැතිවරණය සඳහා ඉදිරිපත් වීම ප්‍රතික්ෂේප කිරීම ආදී තත්ත්වයන් දක්වා අදාල දඬුවම් නියම කිරීමේ හැකියාවන් පැවතිය යුතු වේ. මැතිවරණ සඳහා ඉදිරිපත් වීම ප්‍රතික්ෂේප කිරීම තුලින් වාර්තාකරණය හා බැඳි සියළු අවශ්‍යතා වලින් ඉවත් වීමේ පූර්ණ ඉඩකඩ සැලසේ. අවශ්‍ය පියවරක් ලෙස, යම් දේශපාලන පක්ෂයක් මූල්‍ය අක්‍රමිකතාවන් සිදු කර ඇති බවට සොයා ගතහොත්, (එනම් ඡන්ද මිලදී ගැනීම් හෝ රාජ්‍ය දේපළ අවභාවිතා කිරීම් ආදිය සම්බන්ධයෙන්) එවැනි පක්ෂයක් විසුරුවා හැරීමට වුවද ඉඩකඩ තිබේ. එවැනි දඬුවම් සිවිල් සහ අපරාධමය නඩු සංග්‍රහයන්හි කාර්ය පටිපාටීන් තුලින් සිදු විය යුතුය. කවර ප්‍රවේශයක් අනුගමනය කල ද, අදාළ බලපෑම් සිදු වූ පක්ෂයට අභියාචනය කිරීමේ අයිතිය තිබිය යුතු සේම එකී ක්‍රියාවලින් නීතියෙහි ක්‍රියාපටිපාටියට අනුකූලව සිදුවිය යුතුය.

මෙහිදී බලාත්මක කිරීමේ ආයතනයකට පැහැදිලි නෛතික බලාධිකාරයක් සහ අවශ්‍ය තාක්ෂණික ධාරිතාවයක් තිබීමට අමතරව අදාළ ප්‍රතිපාදන ක්‍රියාත්මක කිරීමට දේශපාලනික ස්වාධීනත්වයක් සහ දේශපාලන ඕනෑකමක් තිබිය යුතුද යන්න පැහැදිලිවම කිව නොහැකිය. මෙකී සුවිශේෂී ලක්ෂණ නොමැති කල්හි, ඕනෑම විධිමත් නියාමන රෙගුලාසියක් නොසළකා හැරීමට ඉඩකඩ තිබේ.

## සිවිල් සමාජයෙහි සහ මාධ්‍යයෙහි කාර්යභාරය

*"යම් යම් දේවල් කරවා ගැනීමේ රහස නම් ක්‍රියා කිරීමයි"*
ඩේන්ටි අලිගේරි (ඉතාලි කවියෙකි, 1265-1321)




දේශපාලනයෙහි මුදල් පාලනය කිරීම උදෙසා ශක්තිමත් රාජ්‍ය ආයතනයක් මඟින් බලාත්මක කළ හැකි විධිමත් නියාමන රෙගුලාසි වැදගත් වන අතරම, අත්දැක්ම් තුලින් පෙන්නුම් කෙරෙනු ලබන්නේ එය පමණක් ප්‍රමාණවත් නොවන බවයි. අනෙක් පාර්ශවකරුවන් විසින් දේශපාලන ක්‍රියාවලිය තුළට මුදල් ගලා ඒම සහ ගලා යාම පිළිබඳව ක්‍රියාකාරී ලෙස සුපරීක්ෂණයක් කිරීමේ භූමිකාවට

මූලිකත්වය දිය යුතුය. ස්වාභාවයෙන්ම අනුකූලතාවයකින් යුක්තව ක්‍රියාකිරීමේ වැදගත් කාර්යභාරයක් දේශපාලන පක්ෂ සහ දේශපාලඥයින්ට ඇති අතරම, ඒවාට සම්බන්ධ පුද්ගලයින් ඔවුන්ගේම ක්‍රියාකාරකම්හි වෙනස ඇති කරගන්නා තෙක් දේශපාලන මූල්‍යකරණයෙහි විනිවිදභාවය ඉහළ නැංවීම සඳහා ක්‍රියාත්මක වන උත්සාහයන්ට නතර වී සිටිය නොහැකිය.

## සිවිල් සමාජය

දේශපාලනයෙහි භාවිතා වන මුදල් පාලනයට ලක් කිරීම සම්බන්ධයෙන් ප්‍රධාන පෙළේ භූමිකාවන් රැසක් සිවිල් සමාජයට පවතී. ඡන්ද මිලදී ගැනීමේ යටි පරමාර්ථයන්, රාජ්‍ය දේපල අවභාවිතයන් සහ අනෙකුත් රටවල රීතින් ආදිය පිළිබඳව දැනුමක් සිවිල් සමාජයට තිබිය යුතුවේ. රාජ්‍ය ආයතනයන්ට කටයුතු කිරීමට දේශපාලනික ස්වාධීනත්වයක් හෝ ධාරිතාවයක් නොමැති කාරණාවන්හිදී දේශපාලන පක්ෂයන්හි සහ මැතිවරණ අපේක්ෂකයින්ගේ ක්‍රියාකාරකම් සූක්ෂම ලෙස නිරීක්ෂණය කිරීමේ කාර්යභාරය සිවිල් සමාජයට කළ හැකිය. එවැනි ව්‍යාපෘතින් ලෝකයෙහි බොහෝ රටවල ක්‍රියාවට නංවා ඇති අතර මැතිවරණ නිරීක්ෂණ කණ්ඩායම් විසින් ඔවුන් ආමන්ත්‍රණය කරනු ලබන ගැටළු ක්ෂේත්‍රයන් අතරට වැඩි වශයෙන් දෙශපාලන මුල්‍යකරණය පිළිබඳ කාරණාවන් අදාළ කරගනිමින් සිටී (මෙහිදී දේශපාලන මූල්‍යකරණය පිළිබඳව නිරීක්ෂණය කිරීමේ කටයුතු මැතිවරණ දිනයට බොහෝ කාලයකට පෙර සිටම ඇරඹිය යුතුවේ.)

## මාධ්‍ය

දේශපාලඥයින් මුදල් ලබාගන්නේ කවර ආකාරයෙන්ද යන්න සහ ඒවා ඔවුන් යොදවන්නේ කෙලෙසද යන්න පිළිබඳව ජනතාවට දැනගැනීම තහවුරු කිරීම උදෙසා කටයුතු කිරීමේ වගකීමක් සම්ප්‍රදායික සහ නව මාධ්‍යන්ට ද තිබේ. විධිමත් රීති සහ සමාජීය ප්‍රතිමානයක් උල්ලංඝණය කරනු ලබන ආකාරයෙහි ක්‍රියාකාරකම් පිළිබඳ හෙළිදරව් කිරීම මඟින් දේශපාලන බලය මහජන සහයෝගයක් නොමැතිව වුවද ලඟා කර ගැනීමට උත්සහා දරණ තත්ත්වයන්ට අදාළ පුද්ගලයින් සඳහා දඬුවම් කිරීමට අවශ්‍ය පසුබිම සැකසීමට මාධ්‍යට හැකියාව තිබේ.

නියාමන ප්‍රතිසංස්කරණයන් පසුපස ඇති ප්‍රබල සාධකයක් වන්නේ අපකීර්තියට ලක්වීමයි. සෑම විටම දේශපාලනය මූල්‍යකරණ ප්‍රතිසංස්කරණයන් පිළිබඳ හුවාදැක්වීමක් කිරීමට අපකීර්තියට පත්වීම යන කාරණය හේතු නොවුන ද එතුලින් යම් වෙනසක් සඳහා ඉඩකඩක් සැකසේ. මැතිවරණ ව්‍යාපාරයන් හා බැඳි නියාමක රෙගුලාසි උල්ලංඝණය කිරීම් මඟින් ජනතාව උපරිමෙන් පීඩාවට පත්වී ඇති විටෙක, අනාගතයේහි දී එවැනි තත්ත්වයක් උද්ගත වීම වළක්වාලීම සඳහා යම් ක්‍රියාමාර්ගයක් ගන්නා ලෙසට ඔවුන් ඉල්ලා සිටිය හැකිය.

අධිකරණ දෙපාර්තමේන්තුවෙහි මැතිවරණ අපරාධ අංශයෙහි හිටපු අධ්‍යක්ෂ ක්‍රේග් ඩොසැන්ටෝ අවධාරණය කළ පරිදි "දේශපාලන මූල්‍යකරණය පිළිබඳ අපකීර්තියට ලක්වීම කෙරේ රටක් කවර අන්දමින් ප්‍රතිචාර දක්වන්නේ ද එය එකී රටේ ප්‍රජාතන්ත්‍රික ආයතනයන් හි ශක්තිමත්භාවය තීරණය කිරීමේ වැදගත් නිර්ණායකයක් වේ"[8]

මාධ්‍යයෙහි වගකීම වන්නේ දීර්ඝ කාලීන ඉදිරි පියවරයන් සඳහා පුද්ගලයින්ගේ ක්‍රියාකාරකම් පදනම් කරගත් අපකීර්තියක් පමණක් නොව සමස්ථ තත්ත්වයම ප්‍රවර්ධනය කළ හැකි උත්සාහයක් දැරීමට අවශ්‍ය සහයෝගය දැක්වීමය. අදාළ ප්‍රතිසංස්කරණයන් සිදු කරන බවට දේශපාලඥයින් විසින් මැතිවරණ දිනයට පෙර පොරොන්දු ලබා දීමත් එකී පොරොන්දු මැතිවරණ දිනයෙන් පසුව අමතක කිරීමත් දුර්ලභ කරුණක් නොවේ.

## නිගමනයන්

*"මුදල් සාර්ථකත්වය ඇති නොකරයි, නිදහස එය ඇති කරයි"*
නෙල්සන් මැන්ඩේලා (හිටපු දකුණු අප්‍රිකානු ජනාධිපති)

වසර කිහිපයකට ඉහත දී IFES ආයතනය සහ තවත් සංවිධාන ගණනාවක් සමග එක්ව දේශපාලන මූල්‍යකරණය පාලනය කිරීම සහ විනිවිදභාවය පිළිබඳ ඉහත දශක කිහිපය තුළ සිදුකළා වූ වැඩකටයුතු තුලින් උගත් පාඩම් සමුදායක් හඳුනා ගන්නා ලදි. එකී අත්දැකීම් ලෝකයෙහි කලාපයෙන් කලාපයට සහ රටින් රටට වෙනස් (කාලයත් සමඟමද) වන බව සත්‍යයක් වන අතරම පොදුවේ ගෝලීය වශයෙන් වැදගත් කරුණු 5ක් හඳුනා ගන්නා ලදි. ඒවානම්ඃ

1. ප්‍රජාතන්ත්‍රික දේශපාලනය සඳහා මුදල් අවශ්‍ය කරුණක් වන අතර දේශපාලන ක්‍රියාවලිය තුළ කටයුතු කිරීම සඳහා දේශපාලන පක්ෂ වලට අරමුදල් වෙත ප්‍රවේශයක් තිබිය යුතුය - නියාමන රෙගුලාසි මඟින් සාරවත් තරඟකාරීත්වය යන්න නතර නොවිය යුතුය.
2. මුදල් යනු දේශපාලනයෙහි ගැටළු ඇති නොකරන සාධකයක් බවට කිසිදිනෙක පත් නොවේ - නියාමනය සුදුසුය.
3. දේශපාලනයෙහි මුදල් යන කාරණය පාලනය කිරීමට උපායමාර්ගික යාන්ත්‍රණයන් සැකසීමේදී ඒ ඒ රටේ පසුබිම සහ දේශපාලන සංස්කෘතිය සැලකිල්ලට ලක්කල යුතුවේ.
4. නිසි පරිදි අවබෝධ කරගන්නේ නම් සහ ක්‍රියාත්මක කරන්නේ නම් පමණක් ඵලදායී හෙළිදරව් කිරීම් සහ නියාමන රෙගුලාසි මඟින් දේශපාලනයෙහි මුදල් මඟින් උද්ගත විය හැකි අහිතකර ප්‍රතිඵල පාලනය කිරීමට හැකිය.



[8] ඩොසැන්ටෝ, ක්‍රේග් "අරබුදයෙන් ප්‍රතිසංස්කරණ දක්වා, ඓතිහාසික යථාදර්ශනයක්" වෙලුම 2, අංක 4 2006 පිටුව 11.

5. ඵලදායී සුපරීක්ෂණයක් තිබේද යන්න තීරණය වන්නේ විවිධාකාර පාර්ශවකරුවන්ගේ (එනම්, නියාමනය කරන්නන්, සිවිල් සමාජය සහ මාධ්‍ය වැනි) ක්‍රියාකාරකම් සහ අන්තර් බැඳියාව මතය.

ඉහතින් සඳහන් කළ කරුණු වලට අමතරව, දේශපාලන මූල්‍යකරණය සම්බන්ධයෙන් වන ඵලදායී සුපරීක්ෂණයක් උදෙසා (පූර්ණ අධිකරණයක් කිසි කලෙක සිදු කල නොහැකිය) වසර ගණනාවක් නොව දශක ගණනාවක් ගතවන බව අවබෝධ කර ගැනීම ද වැදගත් ය.

දේශපාලනයෙහි මුදල් පිළිබඳ විනිවිදභාවයක් ප්‍රවර්ධනය කිරීම සඳහා ක්‍රියා කරනු ලබන ඕනෑම පුද්ගලයෙකුට දිර්ඝ කාලීනව ඒ සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ ඉවසීමක් තිබිය යුතුවේ.

කෙසේ නමුත්, මෙකී ප්‍රශ්නයට නිසි විසඳුමක් ලබා දීමට නොහැකි වූවහොත් එහිදී ඡන්දයෙන් නොව මුදල් මඟින් පාලනය කෙරෙන්නාවූ දේශපාලන ක්‍රමවේදයක් බිහිවීමේ අවධානම උද්ගතවේ. දේශපාලන මූල්‍යකරණය පිළිබඳ ඵලදායී පාලනය ඇති කිරීමට නම් සියලු පාර්ශවකරුවන්ගේ සම්මතයෙන් ක්‍රියා කරන චිරස්තායී ක්‍රියා පිළිවෙතක් අනුගමනය කළ යුතුවේ.

## පරිශීලන මූලාශ්‍ර


දූෂණයට එරෙහි රාජ්‍ය කණ්ඩායම (GRECO) යුරෝපියානු කලාපීය කවුන්සිලයෙහි දේශපාලන මූල්‍යකරණය පිළිබඳ උත්සාහය පිළිබඳ තොරතුරු. අන්තර්ජාල ප්‍රවේශය. http://www.coe.int/t/dghl/monitoring/greco/

මැතිවරණ ක්‍රමවේදයන් සඳහා වන අන්තර්ජාතික පදනම (2013) දේශපාලන මූල්‍යකරණ අත්පොත. අන්තර්ජාල ප්‍රවේශය http://ifes.org/publications/tide-political-finance-oversight-handbook. ඉන්දුනීසියානු සහ රුසියානු භාෂාවන්ගේන් ද ලබාගත හැකිය.

ඉන්ටර්නැෂනල් අයිඩියා (2012) දේශපාලන මූල්‍යකරණ දත්ත. අන්තර්ජාල ප්‍රවේශය http://www.idea.int/political-finance/

කොන්ග්‍රස් පුස්තකාලය (2011) මැතිවරණ ව්‍යාපාර මූල්‍යකරණය දල විශ්ලේෂණයක්. අන්තර්ජාල ප්‍රවේශය http://www.loc.gov/law/help/campaign-finance/index.php

නාස්මැචර් කාල්-හයින්ස් (2009) පක්ෂ තරඟකාරිත්වය සඳහා අරමුදල් ; ප්‍රජාතන්ත්‍රවාදී රටවල් 25 ක දේශපාලන මූල්‍යකරණය. නොමොස්

ඕමන්, මැග්නස් සහ හයිනුල්බායි, හානි. (2009) දේශපාලන මූල්‍යකරණය නියාමනය කිරීම, ගෝලීය අත්දැකීම්. මැතිවරණ ක්‍රමවේදයන් සඳහා වන අන්තර්ජාතික පදනම වොෂින්ටන්. ඉංග්‍රීසි, චාරි, ප්‍රංශ, පැෂටෝ සහ රුසියුනු භාෂාවෙන් ලබා ගත හැකිය.

ඕපන් සොසයිටි ජස්ටිස් ඉනිෂියෙටිව් (2004) මැතිවරණ මුල්‍යකරණය නිරීක්ෂණය කිරීම. රාජ්‍ය නොවන සංවිධාන සඳහා වන අත්පොත. අන්තර්ජාල ප්‍රවේශය http://www.soros.org/initiatives/justice/articles_publications/publications/monitoring_20041123

පින්ටෝ-ඩුචින්ස්කි, මයිකල් (2011) අන්තර්ජාතික සසැඳුම. 2011 ජූලි මස මහජන ජීවිතයෙහි ප්‍රමිතීන් පිළිබඳ මහා බ්‍රිතාන්‍ය කමිටුව-පක්ෂ අරමුදල් පිළිබඳව විමර්ෂණ සඳහා සැකසූ අධ්‍යන වර්තාව. අන්තර්ජාල ප්‍රවේශය http://www.public-standards.org.uk/Library/Pinto_Duschinsky___International_Comparisons_August_2011.pdf

දූෂණ විරෝධී සම්පත් පරිශීලන මධ්‍යස්ථානය, දේශපාලනයෙහි මුදල්. අන්තර්පාල ප්‍රවේශය http://www.u4.no/themes/money-in-politics/

ට්‍රාන්ස්පේරන්සි ඉන්ටර්නැෂනල් සහ කාටර් මධ්‍යස්ථානය, ක්‍රිනිස් ව්‍යාපෘතිය. අන්තර්ජාල ප්‍රවේශය http://www.transparency.org/regional_pages/americas/crinis